වක්‍රලේඛ අංක: 09/2019

සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.)
අංක : 109, 4 වන මහල,
මහා වීදිය,
බත්තරමුල්ල.
2019. 07/26.

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්,
සණස සමිති, දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල හා
අනෙකුත් සියළුම ලියාපදිංචි සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

**කොමිෂන් සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන පත්වීම්**

බස්නාහිර පළාතේ සමුපකාර සමිති සේවකයින් කොමිෂන් සභාවේ අනුමැතියෙන් තොරව වැඩ බැලීමට, රාජකාරී ඉටු කිරීමට සහ කොන්ත්‍රාත් පදනම මත සේවකයින් සේවයේ යොදවා ගන්නා අවස්ථා ද, ඇතැම් අවස්ථාවල දී එසේ සේවයේ යොදවා ගැනීමෙන් පසුව කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් කරනු ලබන අවස්ථා ද පවතින බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර ඇත.

02. එබැවින්, මින් ඉදිරියට බස්නාහිර පළාතේ සමුපකාර සමිති විසින් වැඩ බැලීමේ, රාජකාරී ඉටු කිරීම සහ කොන්ත්‍රාත් පත්වීම් අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙතින් පූර්ව අනුමැතිය ලබා ගත යුතු වන අතර, ඒ සඳහා අදාල ලිපිලේඛන පත්වීම ක්‍රියාත්මක වන දිනට අවම වශයෙන් දින තිහකට (මාස 01) ප්‍රථම කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය.

03. එමෙන්ම ප්‍රමාද වී ලැබෙන පත්වීම් මින් ඉදිරියට අනුමත නොකරනු ලබන බව ද කොමිෂන් සභාව විසින් අවධාරණය කර ඇති බව කොමිෂන් සභා නියමය පරිදි දන්වා සිටිමි.

එස්. ජේ. එල්. රංගනී,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් :

1. ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත.
2. ලේකම්, සමුපකාර සංවර්ධන හා වෙළඳ අමාත්‍යාංශය - බස්නාහිර පළාත.
3. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් - බස්නාහිර පළාත.
4. අධ්‍යක්ෂ, සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - බස්නාහිර පළාත.
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ/ගම්පහ/කළුතර)
6. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව.
7. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්.
8. සියළුම සමුපකාර සේවක වෘත්තීය සමිති .